රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2020(2022)**

අංක 1930/12 හා 2015.09.01 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවට අනුකූලව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට සීමිත පදනම යටතේ උසස් කිරීම සඳහා පවත්වනු ලබන විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2022 අගෝස්තු මස කොළඹ දී පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව රාජ්‍ය පරිපාලන ලේකම් වෙත බලය ඇත.

02. 2020.12.31 දිනට,

(i) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහ (5) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නියමිත වැටුප් වර්ධක පහ (5) ම උපයාගෙන ඇති,

(ii) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (5) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති,

(iii) තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී ඇති නිලධරයන් මෙම විභාගය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

03. විශේෂ පන්තියේ නිලධරයන් සඳහා පහත වැටුප් ක්‍රමය බලපැවැත්වේ. :-
(MN-7-2016 -4 පියවර) රු. 43,845-8 x 755 - 18 x 1030 - රු. 68,425

04. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ ක්‍රමය පහත පරිදි වේ. :-

(i) මෙම විභාගයේ ප්‍රතිඵල මත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ 2020.01.01 දින සිට 2020.12.31 දින දක්වා එක් එක් දෙපාර්තමේන්තුවල හා අමාත්‍යාංශවල ඒ ඒ තනතුරේ පවතින පුරප්පාඩු පුරවනු ලැබේ.

(ii) විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වූ සීමිත තරග විභාගයේ ප්‍රතිඵල අදාළ කරගත යුතු වන්නේ 2020.01.01 දින සිට 2020.12.31 දින දක්වා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට පමණි.

(iii) බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| | |
|---|---|
| සීමිත | 40% |
| සේවා පළපුරුද්ද හා කුසලතා | 60% |

(iv) අනුමත තනතුරු සංඛ්‍යාව 04ක් වන විට සීමිත තරග විභාගය යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 25% හා සේවා පළපුරුද්ද හා කුසලතාවය යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 75% විය යුතු අතර, අනුමත තනතුරු සංඛ්‍යාව 03ක් වන විට ඉහත සීමිත තරග විභාගය යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 33.33% හා සේවා පළපුරුද්ද හා කුසලතාව යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 66.66% විය යුතුය.

(v) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු සංඛ්‍යාව 04කට වැඩි නම්, ඉහත ඡේද අංක 04. iii හි සඳහන් ප්‍රතිශතයන්ට යටත්ව සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත පුරප්පාඩු පිරවීම සිදු කළ යුතුය.

(vi) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත ඉන් සමත්වන්නන් අදාළ සෙසු අවශ්‍යතාවන්ද සම්පූර්ණ කර ඇති බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයක්මගින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව විභාගයේ කුසලතා අනුපිළිවෙළ මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විභාගය පැවැත්වූ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි.

(vii) පුරප්පාඩු පිරවීමේදී අයදුම්කරුවන් අතුරින් මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධරයන් ලකුණු අනුපිළිවෙල අනුව අදාළ උසස් කිරීම සඳහා සලකා බලනු ලැබේ.

05. මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍ර මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම්පත අනුව අයදුම්කරුවන් විසින් ස්වකීය අයදුම්පත පිළියෙල කරගත යුතු අතර, ඒ අනුව මධ්‍යම රාජ්‍ය සේවයේ නිලධරයන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ද, පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් ඔවුන් සේවය කරන පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් මගින්ද, **2022.06.03** වන දින හෝ ඊට පෙර, විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනය වෙත තම අයදුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්, විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. *අනන්‍යතාව සනාථ කිරීම :*

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(අ) ජාතික හැඳුනුම්පත්‍රය.
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(ඇ) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කරගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

සටහන :

කෙසේ වුවද කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූලව විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් කටයුතු කළ යුතු ය.

07. *අයදුම්පත් :*

(i) "A4" ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පත්‍රය පිළියෙල කළ යුතුය. අංක 01 සිට 05 තෙක් පළමුවන පිටුවට ඇතුළත් විය යුතුය. අයදුම්පත්‍රය යතුරු ලියනය කර පිළියෙල කරගත හැකි වුවද, එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය.

(ii) අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල භාෂා මාධ්‍ය ඉල්ලුම්පත්‍රවල හා දෙමළ භාෂා මාධ්‍ය ඉල්ලුම්පත්වල අදාළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද ලිවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එබැවින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න අයදුම්කරු විසින් ම විමසා බැලීමට කටයුතු කළ යුතුය. එම අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) අයදුම්කරුවන්ට තම අයදුම්පතේ සඳහන් කළ භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. මෙම විභාගය සඳහා අයදුම්කරුවන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය තුනෙන්ම ඉදිරිපත් වුවහොත් එම මාධ්‍ය තුනෙන්ම විභාගය පවත්වනු ලබන අතර, අයදුම්කරුවන් විසින් තමා පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂා මාධ්‍යයකින් පිළිතුරු සැපයිය යුතුවේ.

(iv) පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධරයන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ වුවත් ඉන්පසු වාරවලදී නිලධරයන් විභාගයට පෙනී සිටින්නේ නම් රු. 600 ක විභාග ගාස්තුවක් 20-03-02-13 වන විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂයට මිනෑම තැපැල්/උප තැපැල්, ප්‍රාදේශීය/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපතේ මුල් පිටපත අයදුම්පතේ අදාළ කොටුවේ ඇලවිය යුතුය. විභාග ගාස්තු සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ. විභාග ගාස්තු ගෙවා ලබා ගන්නා ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව ආපසු ගෙවීම හෝ වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට හෝ ඉඩදෙනු නොලැබේ.

08. (i) *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, අයත්වන රාජ්‍ය සේවය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීමද, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහ සහතිකයද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. එසේම අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(ii) විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාව වෙත දන්වා සිටිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කර ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් එලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබාගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) අයදුම්පතේ විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද, අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයකු ලවා සහතික කර තිබිය යුතුය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දිනයේදී තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

09. ඉහත (08) වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත්වන අයදුම්කරුවන් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියවිලි සලකා බලනු නොලැබේ.

10. *විභාග ප්‍රතිඵල නිකුත් කිරීම :*
මෙම විභාගයේ ප්‍රතිඵල රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

11. *විභාග පරිපාටිය :*

මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඔබ අයදුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(i) I ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ.

(1) අභියෝග්‍යතා පරීක්ෂණය - කාලය පැය 1 යි. - ලකුණු 100 යි
(2) කළමනාකරණය - කාලය පැය 3 යි. - ලකුණු 100 යි.

සුදුසුකම් ලැබීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුවේ.

පළමුවන ප්‍රශ්න පත්‍රය සඳහා විෂයය නිර්දේශය පහත දක්වේ. :-

**අභියෝග්‍යතා පරීක්ෂණය - විෂයය අංකය (1)**

තමා වෙත පැවරෙන කාර්යයන් සාමාන්‍ය කාර්ය සාධන මට්ටම ඉක්ම වූ කාර්යක්ෂමතාවකින් යුතුව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන දැනුම, කුසලතා හා ආකල්ප අත්පත් කර ගෙන තිබේ ද යන්න හා ඒවා භාවිතයේ දී ඉහළ ප්‍රවීණතාවයක් දක්වන්නේ ද යන්න මැන බැලීමේ පරීක්ෂණයකි. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

දෙවැනි ප්‍රශ්න පත්‍රය සඳහා විෂයය නිර්දේශය පහත දක්වේ. :-

**කළමනාකරණය - විෂයය අංකය (2)**

(i) කළමනාකරණ මූලධර්ම
(ii) කළමනාකරණ ශ්‍රිත
සැලසුම් කිරීම
තීරණ ගැනීම
තීරණ ගැනීමේ ක්‍රියාවලිය
සංවිධානය
මාණ්ඩලීකරණය
මෙහෙයවීම
අභිප්‍රේරණ ක්‍රියාවලිය
නායකත්වය
පාලනය
පාලනමය ප්‍රතිපත්ති ක්‍රියාවලිය
(iii) සහභාගීත්ව කළමනාකරණය
(iv) කළමනාකරණ පරිසරය
(v) සිද්ධි අධ්‍යයනය

මෙය ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

12. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන මිනෑම දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත. මෙම නිවේදනයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවක දී වුව ද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

13. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

14. මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වෙන්නේ ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2022 අප්‍රේල් මස 28 වැනි දින,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.